ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,492 - 2026 ජූනි මස 05 සිකුරාදා - 2026.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : II (ආ) ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්	—
තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්	—
බඩු බාහිරාදිය විකිණීම	2402
නොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම	2424
රජයේ නොවන දැන්වීම්	2426
රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්	—
වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්	2445

සැ. යු. - ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත 2026.06.05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූනි මස 26 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූනි මස 12 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2401 - B 082798 — (2026/06)
F 1 -

සංගීත කෘති මහජනතාව ඉදිරියේ ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමට සහ මහජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා වන බලපත්‍ර ගාස්තු ක්‍රමවේදය

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද සාමූහික කළමනාකරණ සංවිධානයක් වන, ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ සංගමය (ACPOSL) වෙත, ගීත කතුවරුන් සහ සංගීත නිර්මාණකරුවන් වෙනුවෙන්, සංගීත නිර්මාණ මහජනතාව ඉදිරියේ ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේ සහ මහජනතාව වෙත සන්නිවේදනය කිරීමේ අයිතිවාසිකම් පරිපාලනය කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීමේ වගකීම පැවරී ඇත.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන ප්‍රකාරව සහ ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) හා කතුවරුන්ගේ සහ නිර්මාණකරුවන්ගේ සංගම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (CISAC) විසින් පිළිගනු ලබන, ප්‍රකාශන හිමිකම් සාමූහික කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් මූලධර්මවලට අනුකූලව, ශ්‍රී ලංකාව තුළ සංගීත නිර්මාණ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීම සහ මහජනතාව වෙත සන්නිවේදනය කිරීමේදී අදාළ කරගත යුතු පහත සඳහන් ගාස්තු ක්‍රමය ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ සංගමය විසින් මෙයින් සම්මත කරනු ලබයි.

මෙම ගාස්තු ක්‍රමය ස්ථාපිත කිරීමේ අරමුණ වනුයේ, අදාළ හිමිකම් දරන්නන් සඳහා සාධාරණ පාරිශ්‍රමිකයක් සහතික කිරීම වන අතරම, සංගීත පරිශීලකයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී විධිමත්, විනිවිදභාවයෙන් යුත් සහ වෙනස් කොට සැලකීමෙන් තොර වූ රාමුවක් සකස් කර දීමයි.

1. අර්ථ දැක්වීම් සහ විවරණ

I. **ACPOSL** යන්නෙන් සංගීත නිර්මාණ සම්බන්ධ අයිතිවාසිකම් පරිපාලනය කරනු ලබන සාමූහික කළමනාකරණ සංවිධානය වන ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ සංගමය අදහස් වේ.

II. **සංගීත කෘති** යන්නෙන්, ඊට අදාළ ඕනෑම සාහිත්‍ය නිර්මාණයක් ද ඇතුළුව, පද මාලා සහිත හෝ රහිත වූ ඕනෑම මුල් සංගීත නිර්මාණයක් අදහස් වේ.

III. **නිර්මාණ එකතුව (Repertoire)** යන්නෙන් ACPOSL හි සාමාජිකයින් හෝ අනුබද්ධ හිමිකම් දරන්නන් විසින් අයිතිවාසිකම් පරිපාලනය කිරීම සඳහා එම සංගමය වෙත බලය පවරා ඇති සංගීත නිර්මාණයන් අදහස් වේ.

IV. **මහජනතාව වෙත ඉදිරිපත් කිරීම** යන්නෙන් මහජනයාට ප්‍රවේශ විය හැකි ඕනෑම ස්ථානයක සංගීත නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ ඕනෑම ආකාරයක් අදහස් වේ.

V. **මහජනතාව වෙත සන්නිවේදනය කිරීම** යන්නෙන් විකාශනය, සම්ප්‍රේෂණය, ප්‍රවාහ (streaming) හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයන් ඇතුළු ඕනෑම ක්‍රමයක් මඟින් සංගීත නිර්මාණයක් මහජනතාව වෙත ලබා දීම අදහස් වේ.

VI. **පරිශීලකයා** යන්නෙන් මෙම ගාස්තු රාමුව යටතේ බලපත්‍රයක් ලබාගත යුතු ආකාරයෙන් සංගීත නිර්මාණ භාවිත කරනු ලබන ඕනෑම තැනැත්තෙකු, සංවිධානයක් හෝ ආයතනයක් අදහස් වේ.

VII. **බලපත්‍රය** යන්නෙන් නිශ්චිත නියමයන් සහ කොන්දේසි යටතේ සංගීත නිර්මාණ භාවිත කිරීම සඳහා ACPOSL විසින් ලබා දෙනු ලබන අවසරය අදහස් වේ.

VIII. **පරිශ්‍රය** යන්නෙන් සංගීත නිර්මාණ භාවිත කරනු ලබන හෝ මහජනතාව වෙත ඉදිරිපත් කරනු ලබන ඕනෑම භෞතික ස්ථානයක් හෝ ආයතනයක් අදහස් වේ.

IX. **උත්සව අවස්ථාව** යන්නෙන් සජීවීව හෝ ශබ්ද පටිගත කිරීම් මාධ්‍යයෙන් සංගීත නිර්මාණ ඉදිරිපත් කරන හෝ මහජනතාව වෙත සන්නිවේදනය කරන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

X. **සංගීත ප්‍රසංගය** යන්නෙන් සංගීතය ප්‍රධාන අරමුණ වන සහ එවැනි ඉදිරිපත් කිරීමක් නැරඹීම හෝ ශ්‍රවණය කිරීම සඳහාම පැමිණෙන ප්‍රේක්ෂකයින් වෙනුවෙන් සංගීත නිර්මාණ සජීවීව ඉදිරිපත් කරනු ලබන සැලසුම් සහගත වැඩසටහනක් අදහස් වේ.

XI. **සජීවී සංගීත වැඩසටහන - ප්‍රසංග නොවන** යන්නෙන් විනෝදාස්වාදයේ කොටසක් ලෙස සංගීත නිර්මාණ සජීවීව ඉදිරිපත් කරන, නමුත් මෙම ගාස්තු රාමුව යටතේ ''සංගීත ප්‍රසංගයක්'' ලෙස වර්ග කළ නොහැකි ඕනෑම වැඩසටහනක් අදහස් වේ.

XII. **DJ වැඩසටහන** යන්නෙන් ප්‍රධාන විනෝදාස්වාද ක්‍රමය ලෙස, තැටි මෙහෙයවන්නෙකු (Disc Jockey) හෝ එවැනි ඉදිරිපත් කරන්නෙකු විසින් පටිගත කරන ලද සංගීතය ඉදිරිපත් කරනු ලබන හෝ මහජනතාව වෙත සන්නිවේදනය කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

XIII. **ධාරිතාව (Capacity)** යන්නෙන් වැඩසටහනකට සහභාගී වීමට අවසර දී ඇති හෝ අපේක්ෂිත, එසේත් නැතිනම් පරිශ්‍රයක රැඳී සිටිය හැකි උපරිම පුද්ගලයින් සංඛ්‍යාව අදහස් වේ.

XIV. **වාණිජමය භාවිතය** යන්නෙන් ආදායම් උපයා ගැනීම හෝ වාණිජමය වාසි ලබා ගැනීම අරමුණු කරගත් ව්‍යාපාරික, වෙළඳ හෝ වෙනත් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් සංගීත නිර්මාණ භාවිත කිරීම අදහස් වේ.

XV. **වාණිජ නොවන භාවිතය** යන්නෙන් ලාභ ලැබීමේ අරමුණකින් තොරව පුණ්‍ය, අධ්‍යාපනික, ආගමික හෝ ප්‍රජා සේවා අරමුණු වෙනුවෙන් සංගීත නිර්මාණ භාවිත කිරීම අදහස් වේ.

XVI. **මහ නගර සභා බල ප්‍රදේශ** යන්නෙන් මහා නගර සභා මගින් පාලනය වන බලප්‍රදේශ අදහස් වේ.

XVII. **නගර සභා බල ප්‍රදේශ** යන්නෙන් නගර සභා මගින් පාලනය වන බලප්‍රදේශ අදහස් වේ.

XVIII. **ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ** යන්නෙන් ප්‍රාදේශීය සභා මගින් පාලනය වන බල ප්‍රදේශ අදහස් වේ.

බලපත්‍රයේ පොදු කොන්දේසි

I. පළමුව වලංගු බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව, ACPOSL විසින් පරිපාලනය කරනු ලබන නිර්මාණ එකතුවට අයත් කිසිදු සංගීත නිර්මාණයක් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීම හෝ මහජනතාව වෙත සන්නිවේදනය කිරීම කිසිදු තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් නොකළ යුතුය.

II. ACPOSL විසින් පිරිනමනු ලබන බලපත්‍රයකින් අවසර දෙනු ලබන්නේ, අදාළ ගාස්තු රාමුවේ දක්වා ඇති විෂය පථය, ප්‍රභේදය සහ කොන්දේසිවලට යටත්ව සංගීත නිර්මාණ භාවිත කිරීමට පමණි.

මෙම බලපත්‍රය මගින් ආවරණය වන්නේ ACPOSL විසින් පරිපාලනය කරනු ලබන සංගීත නිර්මාණවලට අදාළ අයිතිවාසිකම් පමණි. ඊට පහත දෑ ඇතුළත් නොවේ:

1. ගායකයන්ගේ සහ වාදකයන්ගේ අයිතිවාසිකම්
2. ශබ්ද පටිගත කිරීම් නිෂ්පාදකයන්ගේ අයිතිවාසිකම්
3. සමමුහුර්තකරණ (synchronization) හෝ නිෂ්පාදන අයිතිවාසිකම්

III. මේ සඳහා අදාළ හිමිකම් දරන්නන්ගෙන් වෙනම අවසර ලබා ගැනීම අවශ්‍ය විය හැකිය.

IV. සංගීත නිර්මාණවල ඇතැම් භාවිතයන්, ACPOSL විසින් පරිපාලනය නොකරන අයිතිවාසිකම්වලට ද අදාළ විය හැකිය. එවැනි අවස්ථාවල දී පරිශීලකයින් විසින් අදාළ හිමිකම් දරන්නන්ගෙන් අවශ්‍ය සියලුම අවසරයන් ලබා ගත යුතුය.

V. බලපත්‍ර වෙනත් පාර්ශ්වයකට පැවරිය නොහැකි අතර, ඒවා වලංගු වන්නේ බලපත්‍රය නිකුත් කර ඇති නිශ්චිත පරිශ්‍රයට, අවස්ථාවට හෝ පරිශීලකයාට පමණි.

VI. වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්:

1. වාර්ෂික බලපත්‍ර වසර එකක (1) කාලයක් සඳහා පමණක් වලංගු වේ
2. වැඩසටහන්/අවස්ථා සඳහා වන බලපත්‍ර වලංගු වන්නේ එම නිශ්චිත අවස්ථාව සඳහා පමණි

VII. ACPOSL සමඟ ලිඛිතව වෙනත් එකඟතාවයකට පැමිණ නොමැති නම්, සියලුම බලපත්‍ර ගාස්තු පූර්වයෙන් ගෙවිය යුතුය.

VIII. මෙම ගාස්තු රාමුව අදාළ වන්නේ ACPOSL විසින් පරිපාලනය කරනු ලබන නිර්මාණ එකතුවට අයත් සංගීත නිර්මාණ සඳහා පමණි.

IX. යම් සංගීත නිර්මාණයකට අදාළ අයිතිවාසිකම්වලින් කොටසක් පමණක් ACPOSL විසින් පරිපාලනය කරනු ලබන අවස්ථාවක දී, අදාළ බලපත්‍ර ගාස්තුව සංගමය විසින් පරිපාලනය කරනු ලබන අයිතිවාසිකම් කොටසට අනුකූලව සමානුපාතිකව ගණනය කළ යුතුය.

X. අදාළ ගාස්තු ප්‍රභේදය තීරණය කරනු ලබන්නේ සංගීතයේ ස්වභාවය සහ භාවිතය මත පදනම්ව ය. කිසියම් භාවිතයක් ප්‍රභේද කිහිපයක් යටතට වැටෙන අවස්ථාවක දී, වඩාත්ම උචිත ගාස්තු ප්‍රභේදය අදාළ කරගත යුතු ය. මෙම ක්‍රමය යටතේ ගාස්තු තීරණය කිරීමේ දී, අදාළ පරිශ්‍රය හෝ අවස්ථාව පිහිටා ඇති පරිපාලන බල ප්‍රදේශය සැලකිල්ලට ගනු ලැබේ.

මේ අරමුණ සඳහා ප්‍රදේශ පහත පරිදි වර්ගීකරණය කරනු ලැබේ:

I. මහා නගර සහා බල ප්‍රදේශ ;

II. නගර සහා බල ප්‍රදේශ ;

III. ප්‍රාදේශීය සහා බල ප්‍රදේශ.

XI. අදාළ වර්ගීකරණය තීරණය කරනු ලබන්නේ පරිශ්‍රය හෝ අවස්ථාව පවතින ස්ථානය පාලනය කරනු ලබන නිල පළාත් පාලන ආයතනය පදනම් කරගෙන ය. කිසියම් අපැහැදිලි බවක් පවතින අවස්ථාවක දී, අදාළ වර්ගීකරණය තීරණය කිරීමේ අයිතිය ACPOSL සතු වේ.

XII. ඕනෑම භාවිතයක් වර්ගීකරණය කිරීම, කිසියම් වැඩසටහනක් "සංගීත ප්‍රසංගයක්" (Concert) ද *නැතහොත්* "උත්සව අවස්ථාවක්" (Event) ද යන්න තීරණය කිරීම සහ ඒ සඳහා අදාළ වන ගාස්තු ප්‍රභේදය තීරණය කිරීමේ අයිතිය ACPOSL සතු වේ.

XIII. ACPOSL විසින් නියම කරනු ලබන ආකෘතියකට අනුව, නිර්මාණ ලැයිස්තු, වැඩසටහන් මාලා ලැයිස්තු හෝ භාවිතයට අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභීන් බැඳී සිටිය හැකිය.

XIV. සංගීත නිර්මාණ භාවිතය තහවුරු කිරීමට සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා අදාළ පරිශ්‍රයන් හෝ අවස්ථාවන් පරීක්ෂා කිරීමේ අයිතිය ACPOSL සතු වේ.

XV. බලපත්‍රයක් ලබා ගැනීමට අපොහොසත් වීම හෝ නියමිත කොන්දේසිවලට අනුකූල නොවීම, අදාළ බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට මෙන්ම තත් කාලයේ බල පවත්නා නීතිය යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද හේතු විය හැකිය.

XVI. මෙම ගාස්තු රාමුව සංශෝධනය කිරීමට, නව බලපත්‍ර මාදිලි හඳුන්වා දීමට සහ ගාස්තු අනුපාත ප්‍රතිශෝධනය කිරීමට ACPOSL සතු අයිතිය රඳවා තබා ගනී.

XVII. මෙම ගාස්තු රාමුව අදාළ කිරීමේ කාර්යය සඳහා ඕනෑම භාවිතයක්, අවස්ථාවක් හෝ පරිශ්‍රයක් වර්ගීකරණය කිරීමේ අවසාන තීරණාත්මක බලය ACPOSL සතු වේ.

XVIII. කිසියම් අපැහැදිලි බවක් පැන නැගුණහොත්, ඒ පිළිබඳ අර්ථ නිරූපණයන් පවත්නා අදාළ නීතියට යටත් විය යුතුය.

3. වාණිජ පරිශ්‍ර (පසුබිම් සංගීතය)

3.1 අදාළවන ආයතන

මෙම ප්‍රභේදය, පහත දැක්වෙන ස්ථාන ඇතුළුව (නමුත් ඒවාට පමණක් සීමා නොවී), වාණිජ පරිසරයන් තුළ පසුබිම් සංගීතය හෝ පසුතල සංගීතය (ambient music) ලෙස සංගීත නිර්මාණ භාවිත කිරීම සඳහා අදාළ වේ:

- සුපිරි වෙළඳසැල් සහ සිල්ලර වෙළඳසැල්
- සාප්පු සංකීර්ණ, ආකේඩ් සහ ප්ලාසා
- බැංකු සහ මූල්‍ය ආයතන
- කාර්යාල ගොඩනැගිලි සහ වාණිජ සංකීර්ණ
- ප්‍රදර්ශනාගාර සහ ප්‍රදර්ශන සංකීර්ණ
- සිනමා ශාලා (චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ අයිතිවාසිකම් හැර)

3.2 බලපත්‍රයේ විෂය පථය

මෙම බලපත්‍රය මගින් ආවරණය වන්නේ පහත සඳහන් ක්‍රම ඇතුළුව (නමුත් ඒවාට පමණක් සීමා නොවී), පසුබිම් හෝ පසුතල අරමුණු සඳහා පමණක් සංගීත නිර්මාණ භාවිත කිරීමයි:

- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන
- ඩිජිටල් ප්‍රවාහ (Digital streaming) සේවාවන්
- ගබඩා කරන ලද හෝ භෞතික මාධ්‍ය

මෙහිදී සංගීතය, අදාළ ස්ථානයේ ප්‍රධාන ආකර්ෂණය හෝ මූලික විනෝදාස්වාද සැපයුම නොවිය යුතුය.

3.3 බහුවිධ පරිහරණය සහිත පරිශ්‍ර

සාප්පු සංකීර්ණ, වාණිජ සංකීර්ණ හෝ ඒ හා සමාන ස්ථාන ඇතුළුව (නමුත් ඒවාට පමණක් සීමා නොවී), යම් පරිශ්‍රයක් ස්වාධීන ව්‍යාපාර හෝ ඒකක කිහිපයකින් සමන්විත වන අවස්ථාවක දී, එම පරිශ්‍රයේ පොදු ප්‍රදේශ සඳහා ලබා ගන්නා බලපත්‍රයක් එම පරිශ්‍රය තුළ ක්‍රියාත්මක වන තනි තනි ඒකක හෝ ව්‍යාපාර සඳහා අදාළ නොවිය යුතුය.

එවැනි තනි ඒකක හෝ ව්‍යාපාරික පරිශ්‍රයන් තුළ සිදුවන ඕනෑම සංගීත නිර්මාණ භාවිතයක් සඳහා වෙනම බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ. එම බලපත්‍ර ගාස්තුව, අදාළ ඒකකයේ හෝ පරිශ්‍රයේ බිම් ප්‍රමාණය ඇතුළු අදාළ ගාස්තු රාමුව මත පදනම්ව තීරණය කරනු ලැබේ.

3.4 වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍යවන භාවිතයන්

පහත සඳහන් භාවිතයන් මෙම බලපත්‍රය යටතේ ආවරණය නොවන අතර, ඒ සඳහා අදාළ ගාස්තු ප්‍රභේදය යටතේ වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ:

- සජීවී ඉදිරිපත් කිරීම් (සංගීත කණ්ඩායම්, ඒකල ශිල්පීන්, ආදිය)
- DJ ඉදිරිපත් කිරීම් හෝ විශේෂයෙන් සකස් කරන ලද සංගීත වැඩසටහන්
- ප්‍රවේශ පත්‍ර නිකුත් කරන හෝ අනුග්‍රහය දක්වන වැඩසටහන්
- විශේෂ වැඩසටහන් සම්පාදනය (කාලීනමය හෝ උත්සව අවස්ථා ඇතුළුව)

3.5 වාණිජ පරිශ්‍ර වර්ගීකරණය

වර්ගය	*පරිශ්‍රයේ ස්වභාවය*
A වර්ගය:	බැංකු සහ මූල්‍ය ආයතන, කාර්යාල ගොඩනැගිලි සහ වාණිජ සංකීර්ණ, ප්‍රදර්ශනාගාර සහ ප්‍රදර්ශන සංකීර්ණ, සිනමා ශාලා
B වර්ගය:	සාප්පු සංකීර්ණ, ආකේඩ්, ජ්ලාසා සහ ඒ හා සමාන ආයතන
C වර්ගය:	සුපිරි වෙළඳසැල්, සිල්ලර වෙළඳසැල් සහ ඒ හා සමාන ව්‍යාපාර

3.6 බලපත්‍ර ගාස්තු (වාර්ෂික)

පරිශ්‍ර	*ප්‍රමාණය (වර්ග අඩි)*	*බලපත්‍ර ගාස්තු (රු.)*		
		මහ නගර සහ බල ප්‍රදේශ	*නගර සහ බල ප්‍රදේශ*	*ප්‍රාදේශීය සහ බල ප්‍රදේශ*
A වර්ගය	10,000 ට පහළ	50,000.00	25,000.00	15,000.00
	10,000 ට ඉහළ	100,000.00	50,000.00	25,000.00
B වර්ගය	50,000 ට ඉහළ	30,000.00	20,000.00	8,000.00
	50,000 - 300,000	100,000.00	75,000.00	40,000.00
	300,000 ට ඉහළ	150,000.00	100,000.00	60,000.00
C වර්ගය	2,000 ට ඉහළ	5,000.00	4,000.00	2,500.00
	2,000 – 5,000	8,000.00	6,500.00	4,000.00
	5,000 – 10,000	25,000.00	15,000.00	6,500.00
	10,000 – 25,000	40,000.00	20,000.00	15,000.00
	25,000 ට ඉහළ	වර්ග අඩියකට 2.0/=	වර්ග අඩියකට 1.5/=	වර්ග අඩියකට 1.0/=

3.7 බලපත්‍ර ලබා දීමේ පදනම

- බලපත්‍රය එක් එක් පරිශ්‍රය/ස්ථානය සඳහා අදාළ වේ.
- බලපත්‍රලාභීන් විසින් අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාළ බිම් ප්‍රමාණය නිවැරදිව ප්‍රකාශ කළ යුතු ය.
- එවැනි ප්‍රකාශයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

4. ආගන්තුක සත්කාරක ආයතන

4.1 අදාළ වන ආයතන

මෙම ප්‍රභේදය පහත දැක්වෙන නවාතැන් පහසුකම් සපයන ආයතන සඳහා අදාළ වේ:

- හෝටල් (Hotels)
- අමුත්තන්ගේ නිවාස (Guest Houses)
- ලැගුම්හල් (Lodges)
- විවේක බංගලා (Holiday Villas)
- සංචාරක නිකේතන (Resorts)
- නිවාස නවාතැන් (Homestays) සහ ඒ හා සමාන පහසුකම්

4.2 බලපත්‍රයේ විෂය පථය

පහත දැක්වෙන ස්ථාන ද ඇතුළුව, පරිශ්‍රය තුළ පසුබිම් හෝ පසුතල අරමුණු සඳහා සංගීත නිර්මාණ භාවිත කිරීම මෙම බලපත්‍රය මඟින් ආවරණය කෙරේ:

- ආගන්තුක කාමර
- පිවිසුම් ශාලා සහ පිළිගැනීමේ ප්‍රදේශ
- ආපනශාලා සහ භෝජන ප්‍රදේශ
- කොරිඩෝ සහ පොදු ප්‍රදේශ

සංගීතය පහත ක්‍රම මඟින් ලබා දිය හැකිය:

- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන
- ඩිජිටල් ප්‍රවාහ සේවාවන්
- ගබඩා කරන ලද හෝ භෞතික මාධ්‍ය

4.3 වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන භාවිතයන්

පහත සඳහන් භාවිතයන් මෙම බලපත්‍රය යටතේ ආවරණය නොවන අතර, ඒ සඳහා අදාළ ගාස්තු ප්‍රභේදය යටතේ වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ:

- සජීවී ඉදිරිපත් කිරීම් (සංගීත කණ්ඩායම්, ඒකල ශිල්පීන්, විනෝදස්වාදය සපයන්නන්)
- DJ ඉදිරිපත් කිරීම් සහ සංගීතය ප්‍රධාන වන වැඩසටහන්
- ප්‍රවේශ පත්‍ර නිකුත් කරන ලද හෝ අනුග්‍රහය දක්වන ලද වැඩසටහන්
- සංගීතය ඇතුළත් වන භෝජන සංග්‍රහ, සම්මන්ත්‍රණ සහ විශේෂ උත්සව

4.4 ආයතන වර්ගීකරණය

ආයතන වර්ගීකරණය කිරීමේදී, අදාළ වන අවස්ථාවලදී සම්මත ආගන්තුක සත්කාරක ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව පහත පරිදි වර්ග කරනු ලැබේ:

- තරු 5 පන්තියේ / අධි සුඛෝපභෝගී හෝටල්
- තරු 4 පන්තියේ හෝටල් / සංචාරක නිකේතන / සමාජ ශාලා
- තරු 3 පන්තියේ හෝටල්
- තරු 2 පන්තියේ හෝටල්
- වෙනත් නවාතැන් පහසුකම් සපයන ආයතන

4.5 බලපත්‍ර ගාස්තු

කාමරයක් සඳහා දෛනික බලපත්‍ර ගාස්තුව

දේපළ වර්ගය	*බලපත්‍ර ගාස්තුව (රු.)*		
	මහ නගර සහා ප්‍රදේශ	*නගර සහා ප්‍රදේශ*	*ප්‍රාදේශීය සහා ප්‍රදේශ*
• තරු 5 පන්තිය / අධි සුඛෝපභෝගී හෝටල්	30.00	25.00	20.00
• තරු 4 පන්තියේ හෝටල් / සංචාරක නිකේතන / සමාජ ශාලා	15.00	12.00	10.00
තරු 3	10.00	8.00	6.00
තරු 2	5.00	4.00	3.00
වෙනත්	2.00	2.00	1.00

4.6 බලපත්‍ර ලබා දීමේ පදනම

- බලපත්‍රය එක් එක් ආයතනය සඳහා අදාළ වේ.
- අවම බලපත්‍ර කාලසීමාව වසර එකකි (1).
- මුළු ගාස්තුව = දෛනික ගාස්තුව × කාමර සංඛ්‍යාව × දින ගණන
- මුළු කාමර සංඛ්‍යාව නිවැරදිව ප්‍රකාශ කළ යුතුය.
- එවැනි ප්‍රකාශයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.
- අදාළ වන අවස්ථාවලදී, ACPOSL විසින් අවම වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් නියම කරනු ලැබිය හැකිය.

5. ආහාර සහ පාන වර්ග සපයන ආයතන

5.1 අදාළ වන ආයතන

මෙම ප්‍රඥප්තිය, ආහාර සහ/හෝ පාන වර්ග පිරිනමනු ලබන සහ පරිශ්‍රය තුළ සංගීතය භාවිත කරනු ලබන පහත දැක්වෙන ආයතන සඳහා අදාළ වේ:

- ආපනශාලා
- කැෆේ සහ කෝපි හල්
- මත්පැන් හල් සහ පබ්
- විවේකාගාර සහ රාත්‍රී සමාජ ශාලා
- ක්ෂණික ආහාර අලෙවිසැල් සහ භෝජන ආයතන

5.2 බලපත්‍රයේ විෂය පථය

පරිශ්‍රය තුළ පසුබිම් හෝ පරිවේෂණ අරමුණු සඳහා පහත සඳහන් ක්‍රම මඟින් සංගීත නිර්මාණ භාවිත කිරීම මෙම බලපත්‍රය මගින් ආවරණය කෙරේ:

- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන
- ඩිජිටල් ප්‍රවාහ සේවාවන්
- ගබඩා කරන ලද හෝ භෞතික මාධ්‍ය

මෙම බලපත්‍රය මඟින් පහත සඳහන් දෑ ද ආවරණය විය හැකිය:

- ශිල්පීන් තිදෙනෙකු (3) දක්වා සහභාගී වන ආනුෂංගික සජීවී ඉදිරිපත් කිරීම්.

- තැටි මෙහෙයවන්නෙකු (DJ) හෝ ඒ හා සමාන ඉදිරිපත් කරන්නෙකු විසින් පටිගත කරන ලද සංගීතය ආනුෂංගික ලෙස භාවිත කිරීම (මෙහිදී එම භාවිතය විශේෂ වැඩසටහනක් ලෙස ප්‍රවර්ධනය හෝ සංවිධානය කර නොතිබිය යුතුය).

මෙම බලපත්‍රය යටතේ සංගීතය ආනුෂංගික භාවිතයක් ලෙස සැලකිය යුතු අතර, එය අදාළ ආයතනයේ ප්‍රධාන අංගය නොවිය යුතුය. රාත්‍රී සමාජ ශාලා, ඩිස්කෝ, කැසිනෝ සහ ඒ හා සමාන සංගීතය ප්‍රධාන අංගයක් වන ආයතන සඳහා, අදාළ වැඩසටහන් හෝ ඉදිරිපත් කිරීම් ගාස්තු ප්‍රභේදයන් යටතේ අතිරේක බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ.

5.3 වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන භාවිතයන්

පහත සඳහන් භාවිතයන් මෙම බලපත්‍රය යටතේ ආවරණය නොවන අතර, ඒ සඳහා අදාළ ගාස්තු ප්‍රභේදය යටතේ වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ:

- ශිල්පීන් තිදෙනෙකුට (3) වඩා සහභාගී වන සජීවී ඉදිරිපත් කිරීම්
- විශේෂ වැඩසටහන්/උත්සව ගණයට වැටෙන DJ ඉදිරිපත් කිරීම් හෝ සංගීත භාවිතයන්
- ප්‍රවේශ පත්‍ර නිකුත් කරන හෝ අනුග්‍රහය දක්වන වැඩසටහන්
- තේමාත්මක රාත්‍රී වැඩසටහන්, විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් හෝ වැඩසටහන් පදනම් කර ගත් විනෝදාස්වාද සැපයීම්

5.4 DJ වැඩසටහන් වර්ගීකරණය

තැටි මෙහෙයවන්නෙකුගේ (DJ) භාවිතය ප්‍රධාන ආකර්ෂණ මාධ්‍යයක් ලෙස ප්‍රවර්ධනය කරනු ලබන හෝ පවත්වනු ලබන අවස්ථාවකදී, එය වැඩසටහනක් ලෙස වර්ගීකරණය කරනු ලැබිය හැකිය. ප්‍රවේශ ගාස්තු අය කිරීම, අනුග්‍රහකත්වයන් ලබා ගැනීම හෝ විශේෂ වැඩසටහන් සම්පාදනය අදාළ වන අවස්ථා ද මෙයට ඇතුළත් වේ.

එවැනි භාවිතයන් සඳහා, අදාළ වැඩසටහන් ගාස්තු ප්‍රභේදය යටතේ බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ.

5.5 බලපත්‍ර ගාස්තු (වාර්ෂික)

දේපළෙහි ප්‍රමාණය (වර්ග අඩි)	*වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රු.)*		
	මහ නගර සහා ප්‍රදේශ	*නගර සහා ප්‍රදේශ*	*ප්‍රාදේශීය සහා ප්‍රදේශ*
2,500 ට අඩු	40,000.00	30,000.00	15,000.00
2,500 – 5,000	55,000.00	40,000.00	20,000.00
5,000 ට වැඩි	65,000.00	50,000.00	40,000.00

5.6 වැඩසටහන් පදනම් කරගත් බලපත්‍ර ලබා දීම (අතිරේක)

අ) DJ ඉදිරිපත් කිරීම්

- එක් එක් වැඩසටහන හෝ අවස්ථාව අනුව බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ.
- වැඩසටහන පවත්වන ස්ථානයේ ප්‍රමාණය සහ වැඩසටහනේ ස්වභාවය අනුව ගාස්තු තීරණය කරනු ලැබිය හැකිය.
- අවශ්‍ය අවස්ථාවලදී, ඉදිරිපත් කරන ලද සංගීත නිර්මාණ පිළිබඳ වාර්තාවක් බලපත්‍රලාභියා විසින් ACPOSL වෙත ඉදිරිපත් කළ යුතුය.

ආ) සජීව ඉදිරිපත් කිරීම්

- සජීවී සංගීත ඉදිරිපත් කිරීම් සඳහා බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ.
- එක් එක් වැඩසටහන හෝ ඉදිරිපත් කිරීම් වාරය අනුව ගාස්තු අය කරනු ලැබිය හැකිය.
- අවශ්‍ය අවස්ථාවලදී, ඉදිරිපත් කරනු ලබන සංගීත නිර්මාණ නාමාවලිය බලපත්‍රලාභියා හෝ ශිල්පියා විසින් ACPOSL වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇ) විශේෂ වැඩසටහන්

- තේමාත්මක රාත්‍රී වැඩසටහන්, අනුග්‍රහය දක්වන වැඩසටහන් හෝ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මෙය අදාළ වේ.
- මේ සඳහා වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ.

5.7 බලපත්‍ර ලබා දීමේ පදනම

- බලපත්‍රය එක් එක් පරිශ්‍රය/ස්ථානය සඳහා අදාළ වේ.
- බිම් ප්‍රමාණය නිවැරදිව ප්‍රකාශ කළ යුතුය.
- එවැනි ප්‍රකාශයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.
- වැඩසටහන් සඳහා වන බලපත්‍ර, එම වැඩසටහන පැවැත්වීමට ප්‍රථමයෙන් ලබා ගත යුතුය.

6. වැඩසටහන්, DJ සහ සජීව ඉදිරිපත් කිරීම්

6.1 අදාළ වන වැඩසටහන්

මෙම ප්‍රභේදය, සංගීතය ප්‍රධාන අංගයක් ලෙස භාවිත කරනු ලබන පහත දැක්වෙන වැඩසටහන් සඳහා අදාළ වේ:

- DJ ඉදිරිපත් කිරීම් සහ සංගීතය ප්‍රධාන වන වැඩසටහන්
- සජීවී සංගීත ඉදිරිපත් කිරීම් (සංගීත කණ්ඩායම්, ඒකල ශිල්පීන්, විනෝදස්වාදය සපයන්නන්)
- පුද්ගලික සහ සමාජීය උත්සව (විවාහ උත්සව, සාද)
- ආයතනික වැඩසටහන් සහ උත්සව

6.2 වැඩසටහන් වර්ග

අ) DJ වැඩසටහන් – පටිගත කරන ලද සංගීතය ප්‍රධාන විනෝදාස්වාද මාධ්‍යය වන වැඩසටහන්.

ආ) සජීවී සංගීත වැඩසටහන් (සංගීත සංදර්ශන නොවන) – සජීවී සංගීත කණ්ඩායම්, ගායකයන් හෝ ශිල්පීන් සහභාගී වන වැඩසටහන්.

ඇ) පුද්ගලික / ආයතනික වැඩසටහන් – විවාහ උත්සව, පුද්ගලික සාද සහ ආයතනික උත්සව.

6.3 ධාරිතාවය අනුව වර්ගීකරණය

- කුඩා**:** පුද්ගලයින් 100 ට අඩු
- මධ්‍යම**:** පුද්ගලයින් 100 – 300 දක්වා
- විශාල: පුද්ගලයින් 300 ට වැඩි

6.4 බලපත්‍ර ගාස්තුව

වැඩසටහන් වර්ගය	*බලපත්‍ර ගාස්තුව (රු.)*		
	කුඩා	*මධ්‍යම*	*විශාල*
DJ වැඩසටහන්	20,000.00	30,000.00	40,000.00
සජීව සංගීත වැඩසටහන් (සංගීත සංදර්ශන නොවන)	25,000.00	35,000.00	50,000.00
පුද්ගලික/ ආයතනික වැඩසටහන්			
- DJ වැඩසටහන්	25,000.00	40,000.00	60,000.00
- සජීව සංගීත වැඩසටහන්	50,000.00	75,000.00	125,000.00
- දෙමුහුම් වැඩසටහන්	50,000.00	75,000.00	125,000.00

6.5 වැඩසටහන් වර්ගීකරණය තීරණය කිරීම

යම් වැඩසටහනක් පහත දැක්වෙන ලක්ෂණ ඇතුළුව (නමුත් ඒවාට පමණක් සීමා නොවී), සංගීත සංදර්ශනයක ලක්ෂණවලින් සමන්විත වන අවස්ථාවකදී:

- ඉහළ ප්‍රවේශ ගාස්තුවක් අය කිරීම.
- ප්‍රසිද්ධ හෝ ප්‍රධාන පෙළේ ශිල්පීන්ගේ ඉදිරිපත් කිරීම්.
- මහා පරිමාණ නිෂ්පාදනයක් හෝ වේදිකා සැකසුමක් සහිත වීම.
- ප්‍රධාන සංගීත ප්‍රසංගයක් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රවර්ධනය කිරීම.
- සන්නාම අනුග්‍රහය සහිත වැඩසටහන් වීම.

එවැනි වැඩසටහනක් බලපත්‍ර ලබා දීමේ අරමුණ සඳහා ''සංගීත ප්‍රසංගයක්'' ලෙස වර්ගීකරණය කිරීමේ අයිතිය ACPOSL සතු වන අතර, එහිදී ''සංගීත ප්‍රසංග'' ගාස්තු ප්‍රභේදය යටතේ වන ගාස්තු අදාළ විය යුතුය.

එවැනි තීරණය කිරීම් අභ්‍යන්තර සමාලෝචනයට සහ අදාළ බල පවත්නා නීතින්ට යටත් විය හැකිය.

6.6 බලපත්‍ර කොන්දේසි

- බලපත්‍රය අදාළ වැඩසටහන පැවැත්වීමට ප්‍රථමයෙන් ලබා ගත යුතුය.
- අපේක්ෂිත උපරිම සහභාගීත්වය හෝ අවසර ලබා දී ඇති උපරිම ප්‍රේක්ෂක සංඛ්‍යාව මත පදනම්ව ධාරිතාවය තීරණය කරනු ලැබේ.
- ධාරිතාවය නිශ්චිතව තීරණය කළ නොහැකි අවස්ථාවන්හිදී, වැඩසටහන වර්ගීකරණය කිරීමේ අයිතිය ACPOSL සතු වේ.
- යම් වැඩසටහනක් තුළ විවිධ ආකාරයේ සංගීත භාවිතයන් ඇතුළත් වන්නේ නම්, ඒ සඳහා අදාළ වන ඉහළම ගාස්තු ප්‍රභේදය අදාළ වේ.
- අවශ්‍ය අවස්ථාවලදී, ඉදිරිපත් කරන සංගීත නිර්මාණ නාමාවලිය ACPOSL වෙත ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභීන් බැඳී සිටී.

6.7 බලපත්‍ර ලබා දීමේ පදනම

- බලපත්‍රය එක් එක් වැඩසටහන සඳහා අදාළ වේ.
- සෑම වැඩසටහනක් සඳහාම වෙනම බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ.
- වැඩසටහනේ විස්තර සහ අනුකූලතාවය පරීක්ෂා කිරීමේ සහ තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

7. සංගීත ප්‍රසංග

7.1 අදාළ වන වැඩසටහන්

මෙම ගාස්තු ප්‍රභේදය යටතේ අර්ථ දක්වා ඇති පරිදි, පහත සඳහන් සංගීත සංදර්ශන සඳහා මෙම ප්‍රභේදය අදාළ වේ:

- ප්‍රවේශ පත්‍ර නිකුත් කරන සජීව සංගීත ඉදිරිපත් කිරීම්
- ප්‍රසිද්ධ සංගීත සංදර්ශන සහ ප්‍රසංග
- යම් වැඩසටහනක ප්‍රධාන ආකර්ෂණය ලෙස පවත්වනු ලබන සංගීතමය ඉදිරිපත් කිරීම්
- සංගීත උළෙලවල් සහ මහා පරිමාණ සංගීත වැඩසටහන්

7.2 බලපත්‍රයේ විෂය පථය

පහත දැක්වෙන ආකාරයට පවත්වනු ලබන සංගීත සංදර්ශනයකදී සංගීත නිර්මාණ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීම මෙම බලපත්‍රය මගින් ආවරණය කෙරේ:

- සජීව ශිල්පීන් (සංගීත කණ්ඩායම්, ඒකල ශිල්පීන්, වාදක කණ්ඩායම්) විසින් ඉදිරිපත් කරනු ලබන; හෝ
- සජීව සහ පටිගත කරන ලද ඕනෑම අංගයන්ගේ එකතුවක් මගින් ඉදිරිපත් කරනු ලබන.

7.3 පටිගත කිරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ අයිතීන්

මෙම බලපත්‍රය මගින් ආවරණය කරනු ලබන්නේ වැඩසටහන පැවැත්වෙන අවස්ථාවේදී සංගීත නිර්මාණ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කිරීම සඳහා පමණි.
එම ඉදිරිපත් කිරීම් පටිගත කිරීම, විකාශනය කිරීම, ඩිජිටල් ප්‍රවාහ හෝ ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය-ශ්‍රව්‍ය මාධ්‍ය මගින් සිදුකරන යම් ආකාරයක සම්ප්‍රේෂණයක් හෝ බෙදාහැරීමක් සඳහා මෙම බලපත්‍රය අදාළ නොවේ.
එවැනි ඕනෑම භාවිතයක් සඳහා ACPOSL සහ/හෝ අදාළ හිමිකම්ධාරීන්ගෙන් පූර්ව ලිඛිත අවසරයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

7.4 බලපත්‍ර ගාස්තුව (එක් නිර්මාණයක් සඳහා)

බලපත්‍ර ගාස්තුව ගණනය කරනු ලබන්නේ භාවිත වන එක් එක් සංගීත නිර්මාණය පදනම් කරගෙන වන අතර, එක් නිර්මාණයක් සඳහා වන උපරිම ගාස්තු අනුපාතය රුපියල් 10,000/- කි.

7.5 බලපත්‍ර ගාස්තු තීරණය කිරීම

එක් සංගීත නිර්මාණයක් සඳහා අදාළ වන ගාස්තුව, වැඩසටහන පිළිබඳව සිදු කරනු ලබන ව්‍යුහගත ඇගයීමක් මත පදනම්ව ACPOSL විසින් තීරණය කරනු ලැබේ. එහිදී පහත සඳහන් සාධක ඇතුළුව (නමුත් ඒවාට පමණක් සීමා නොවී) අනෙකුත් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

- ප්‍රේක්ෂක ධාරිතාවය
- වැඩසටහන පවත්වන ස්ථානය
- වැඩසටහන ගෘහස්ථව හෝ එළිමහනේ පවත්වන්නේ ද යන්න
- වැඩසටහන ප්‍රවේශ පත්‍ර නිකුත් කරන හෝ නොකරන එකක්ද යන්න
- වැඩසටහනේ වාණිජ හෝ වාණිජ නොවන ස්වභාවය
- වැඩසටහනේ පරිමාණය සහ නිෂ්පාදන වටිනාකම

අදාළ බලපත්‍ර ගාස්තුව තීරණය කිරීමේදී, ඉහත සඳහන් සාධක මත පදනම් වූ අරමුණු මත බර තබන ලද ගාස්තු ආකෘතියක් (objective weighted tariff model) භාවිත කිරීමට ACPOSL හට හැකියාව ඇත.

ඉහත සාධක මත පදනම්ව, නියමිත උපරිම සීමාව ඇතුළත අදාළ ගාස්තුව තීරණය කිරීමේ අයිතිය ACPOSL සතු වේ.

7.6 විශේෂිත කොන්දේසි

- සංගීත සංදර්ශන සඳහා බලපත්‍ර ගාස්තු ගණනය කරනු ලබන්නේ, එම වැඩසටහනේදී ඉදිරිපත් කරනු ලබන එක් එක් ගීතය පදනම් කරගෙනය.
- සංවිධායකවරයා විසින් වැඩසටහනේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සියලුම සංගීත නිර්මාණ ඇතුළත් සම්පූර්ණ නාමාවලියක් වැඩසටහනට ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතුය.
- අවශ්‍යතාවය පරිදි, වැඩසටහන අවසන් වූ පසුව අවසාන නාමාවලියක් ඉදිරිපත් කිරීම අවශ්‍ය විය හැකිය.
- එවැනි ඉදිරිපත් කිරීම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.
- බලපත්‍ර ලබා දීමේ අරමුණ සඳහා, ඉදිරිපත් කරනු ලබන සෑම තනි සංගීත නිර්මාණයක්ම එක් (1) ඒකකයක් ලෙස ගණන් ගනු ලැබේ.
- ගීත බණ්ඩ කිහිපයක එකතුවක් (Medleys), ගීත සංයෝග (Mashups) හෝ නිර්මාණයක කොටසක් ඉදිරිපත් කිරීමේදී, අදාළ වන අවස්ථාවලදී ඒවා වෙනම නිර්මාණ ලෙස සලකනු ලැබිය හැකිය.
- මෙම ගාස්තු ප්‍රභේදය අදාළ වන්නේ ACPOSL විසින් පාලනය කරනු ලබන සංගීත නිර්මාණවල අයිතීන් සඳහා පමණි.
- සංගීත නිර්මාණයක අයිතීන්වලින් කොටසක් පමණක් ACPOSL විසින් නියෝජනය කරනු ලබන අවස්ථාවකදී, අදාළ බලපත්‍ර ගාස්තුව ACPOSL විසින් පාලනය කරනු ලබන අයිතිවාසිකම් කොටසට අනුපාතිකව ගණනය කළ යුතුය.

7.7 සංගීත සංදර්ශන වර්ගීකරණය

මෙම ගාස්තු ප්‍රභේදයේ අරමුණු සඳහා, යම් වැඩසටහනක් සංගීත සංදර්ශනයක් ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ:

- සංගීතය එම වැඩසටහනේ මූලික පරමාර්ථය වන විට; සහ
- එම පරමාර්ථය වෙනුවෙන්ම සහභාගී වන ප්‍රේක්ෂක පිරිසක් සඳහා සංගීත නිර්මාණ ඉදිරිපත් කිරීමට ම වෙන් වූ ප්‍රසංගයක් ලෙස වැඩසටහන සංවිධානය කර ඇති විට ය.

යම් වැඩසටහනක් සංගීත සංදර්ශනයක් ලෙස සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කිරීමේදී, ACPOSL විසින් පහත සඳහන් සාධක සලකා බලනු ලැබිය හැකිය :

- වැඩසටහන සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කර තිබේ ද *නැතහොත්* එය ප්‍රසිද්ධියේ ප්‍රවර්ධනය කර තිබේ ද යන්න.

- ඉදිරිපත් කිරීමේ ස්වභාවය සහ පරිමාණය.
- වෘත්තීය මට්ටමේ ශිල්පීන්ගේ සහභාගීත්වය හෝ ව්‍යුහගත වැඩසටහන් සම්පාදනයක් පවතින්නේද යන්න.
- වැඩසටහන සමස්තයක් ලෙස සංගීතය කේන්ද්‍ර කරගත් ඉදිරිපත් කිරීමක් ලෙස ඉදිරිපත් කර තිබේද යන්න.

7.8 වර්ගීකරණය තීරණය කිරීම

ඕනෑම වැඩසටහනක ස්වභාවය, පරිමාණය සහ ලක්ෂණ මත පදනම්ව එහි වර්ගීකරණය තීරණය කිරීමේ අයිතිය ACPOSL සතු වන අතර, බලපත්‍ර ලබා දීමේ අරමුණු සඳහා එම තීරණය අවසානාත්මක විය යුතුය.

7.9 බලපත්‍ර ලබා දීමේ පදනම

- බලපත්‍රය එක් එක් වැඩසටහන සඳහා අදාළ වේ.
- සෑම සංගීත සංදර්ශනයක් සඳහාම වෙනම බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ.
- බලපත්‍රය අදාළ වැඩසටහන පැවැත්වීමට ප්‍රථමයෙන් ලබා ගත යුතුය.

8. සේවා නැඹුරු ආයතන

8.1 අදාළ වන ආයතන

සේවා නැඹුරු හෝ වාණිජ පරිසරයන්හි පසුබිම් හෝ පසුතල අරමුණු සඳහා සංගීතය භාවිත කරනු ලබන පහත දැක්වෙන ආයතන සඳහා මෙම ප්‍රභේදය අදාළ වේ:

- සෞඛ්‍ය සමාජ, ව්‍යායාම මධ්‍යස්ථාන සහ ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථාන
- රෝහල්, සායන සහ වෛද්‍ය මධ්‍යස්ථාන
- රූපලාවන්‍යාගාර සහ සුවතා මධ්‍යස්ථාන
- ඉන්ධන පිරවුම්හල් සහ සේවා මධ්‍යස්ථාන
- රැඳී සිටීමේ ස්ථාන සහ පාරිභෝගික සේවා පහසුකම් සපයන ස්ථාන
- ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තට ආනුෂංගිකව සංගීතය භාවිත කරනු ලබන ඒ හා සමාන ඕනෑම ආයතනයක්

8.2 බලපත්‍රයේ විෂයය පථය

පරිශ්‍රය තුළ පසුබිම් හෝ පසුතල අරමුණු සඳහා පමණක් සංගීත නිර්මාණ භාවිත කිරීම මෙම බලපත්‍රය මගින් ආවරණය වන අතර, ඊට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන
- ඩිජිටල් ප්‍රවාහ සේවා
- ගබඩා කරන ලද හෝ භෞතික මාධ්‍ය

මෙහිදී සංගීතය ප්‍රධාන ආකර්ෂණය හෝ ප්‍රධාන විනෝදාස්වාද සැපයුම නොවිය යුතුය.

8.3 වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන භාවිතයන්

පහත සඳහන් භාවිතයන් මෙම බලපත්‍රය යටතේ ආවරණය නොවන අතර, ඒ සඳහා අදාළ ගාස්තු ප්‍රභේදය යටතේ වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ:

- සජීවී ඉදිරිපත් කිරීම් (සංගීත කණ්ඩායම්, ඒකල ශිල්පීන්, විනෝදස්වාදය සපයන්නන්)
- DJ ඉදිරිපත් කිරීම් හෝ සංගීතය ප්‍රධාන වන වැඩසටහන්
- සංගීතය ඇතුළත් අනුග්‍රහක හෝ ප්‍රවර්ධන වැඩසටහන්
- ප්‍රවේශ පත්‍ර නිකුත් කරන ලද හෝ පොදු වැඩසටහන්

8.4 බලපත්‍ර ගාස්තුව (වාර්ෂික)

පරිශ්‍රයේ ප්‍රමාණය *(වර්ග අඩි)*	*බලපත්‍ර ගාස්තුව (රු.)*		
	මහ නගර සහා ප්‍රදේශ	*නගර සහා ප්‍රදේශ*	*ප්‍රාදේශීය සහා ප්‍රදේශ*
5,000 ට අඩු	10,000.00	8,000.00	5,000.00
5,000 – 10,000	25,000.00	15,000.00	10,000.00
10,000 ට වැඩි	වර්ග අඩියකට 35/=	වර්ග අඩියකට 25/=	වර්ග අඩියකට 15/=

8.5 බලපත්‍ර ලබා දීමේ පදනම

- බලපත්‍රය එක් එක් පරිශ්‍රය හෝ ස්ථානය පදනම් කරගෙන අදාළ වේ.
- බලපත්‍රය ලබා ගන්නා අවස්ථාවේදී අදාළ බිම් ප්‍රමාණය නිවැරදිව ප්‍රකාශ කළ යුතුය.
- එවැනි ප්‍රකාශයන්ගේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

9. පොදු ස්ථාන සහ රැඳී සිටීමේ ප්‍රදේශ
9.1 අදාළ වන ස්ථාන

පසුතල හෝ පසුබිම් අරමුණු සඳහා සංගීතය භාවිත කරනු ලබන, පහත දැක්වෙන ස්ථාන ඇතුළු පොදු සහ අර්ධ-පොදු ස්ථාන සඳහා මෙම ප්‍රභේදය අදාළ වේ:

- ගුවන් තොටුපළවල්
- දුම්රිය ස්ථාන
- බස් නැවතුම්පළවල් සහ පර්යන්ත
- අතරමැදි විවේක අංගණ (Transit lounges) සහ රැඳී සිටීමේ ශාලා
- අධිවේගී මාර්ග සේවා පහසුකම් සපයන මධ්‍යස්ථාන
- ඒ හා සමාන ඕනෑම පොදු රැඳී සිටීමේ හෝ අතරමැදි ස්ථානයක්

9.2 බලපත්‍රයේ විෂයය පථය

මෙම බලපත්‍රය මගින් එවැනි ස්ථාන තුළ, පහත සඳහන් ක්‍රම ඇතුළුව පසුබිම් හෝ පසුතල අරමුණු සඳහා සංගීත නිර්මාණ භාවිත කිරීම ආවරණය කරනු ලබයි:

- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන
- ඩිජිටල් ප්‍රවාහ සේවාවන්
- ගබඩා කරන ලද හෝ භෞතික මාධ්‍ය
- මහජන ඇමතුම් පද්ධති සහ ප්‍රදර්ශන පද්ධති

මෙහිදී සංගීතය, අදාළ ස්ථානයේ ප්‍රධාන ආකර්ෂණය හෝ මූලික විනෝදාස්වාද සැපයුම නොවිය යුතුය.

9.3 වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන භාවිතයන්

පහත සඳහන් භාවිතයන් මෙම බලපත්‍රය යටතේ ආවරණය නොවන අතර, ඒ සඳහා අදාළ ගාස්තු ප්‍රභේදය යටතේ වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ:

- සජීවී ඉදිරිපත් කිරීම් (සංගීත කණ්ඩායම්, ඒකල ශිල්පීන්, විනෝදාත්මක ශිල්පීන්)
- DJ ඉදිරිපත් කිරීම් හෝ සංවිධානාත්මක සංගීත වැඩසටහන්
- සංගීතය ඇතුළත්, අනුග්‍රහය දක්වන හෝ ප්‍රචාරණ වැඩසටහන්
- ප්‍රවේශ පත්‍ර නිකුත් කරන හෝ පොදු විනෝදාස්වාද වැඩසටහන්

9.4 බලපත්‍ර ගාස්තුව (වාර්ෂික)

ස්ථානය	*බලපත්‍ර ගාස්තුව (රු.)*		
	මහ නගර සභා ප්‍රදේශ	*නගර සභා ප්‍රදේශ*	*ප්‍රාදේශීය සභා ප්‍රදේශ*
ගුවන්තොටුපොළ	500,000.00	500,000.00	500,000.00
දුම්රිය පර්යන්ත	15,000.00	10,000.00	7,500.00
බස් පර්යන්ත	15,000.00	10,000.00	7,500.00
අධිවේගී මාර්ග සේවා ප්‍රදේශ	50,000.00	30,000.00	20,000.00

9.5 බලපත්‍ර ලබාදීමේ පදනම

- බලපත්‍රය එක් එක් පරිශ්‍රය හෝ ස්ථානය පදනම් කරගෙන අදාළ වේ.
- අදාළ පරිශ්‍රය සම්බන්ධයෙන් වගකීම දරනු ලබන මෙහෙයුම්කරු හෝ අධිකාරිය විසින් බලපත්‍රය ලබාගත යුතුය.
- සංගීත නිර්මාණ භාවිතය සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

10. ප්‍රවාහන සේවා

10.1 අදාළ වන ප්‍රවාහන මාදිලි

වාහන හෝ ප්‍රවාහන පද්ධති තුළ සංගීත නිර්මාණ පොදු ජනතාව වෙත සන්නිවේදනය කරනු ලබන පහත දැක්වෙන ප්‍රවාහන සේවාවන් සඳහා මෙම ප්‍රභේදය අදාළ වේ:

- ගුවන් යානා (ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන දේශීය සහ ජාත්‍යන්තර මෙහෙයුම්)
- මගී දුම්රිය සහ දුම්රිය සේවා
- මගී බස් රථ, කෝච් රථ සහ සංචාරක ප්‍රවාහන වාහන
- වාරිකා නෞකා , මුහුදු යාත්‍රා සහ ඒ හා සමාන ප්‍රවාහන සේවා
- යානය තුළ ශ්‍රව්‍ය හෝ විනෝදාස්වාද පද්ධති සපයන වෙනත් ඕනෑම ප්‍රවාහන මාදිලියක්

10.2 බලපත්‍රයේ විෂය පථය

ප්‍රවාහන පද්ධති තුළ මගීන්ගේ විනෝදාස්වාදය සඳහා පහත සඳහන් ක්‍රම ඇතුළුව සංගීත නිර්මාණ භාවිත කිරීම මෙම බලපත්‍රය මඟින් ආවරණය කරනු ලබයි:

- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන
- ඩිජිටල් ප්‍රවාහ හෝ යානය තුළ ඇති විනෝදාස්වාද පද්ධති
- ගබඩා කරන ලද හෝ භෞතික මාධ්‍ය

මෙහිදී සංගීතය, ප්‍රවාහන සේවාවට ආනුෂංගික විය යුතු අතර එය මූලික අරමුණ නොවිය යුතුය.

10.3 වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන භාවිතයන්

පහත සඳහන් භාවිතයන් මෙම බලපත්‍රය යටතේ ආවරණය නොවන අතර, ඒ සඳහා අදාළ ගාස්තු ප්‍රභේදය යටතේ වෙනම බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වේ:

- යානය තුළ සිදුකරන සජීවී ඉදිරිපත් කිරීම්
- DJ ඉදිරිපත් කිරීම් හෝ සංවිධානාත්මක විනෝදාස්වාද වැඩසටහන්
- සංගීතය ඇතුළත්, අනුග්‍රහය දක්වන ලද හෝ ප්‍රචාරණ වැඩසටහන්
- ප්‍රවාහන සේවාවට අමතරව පවත්වනු ලබන, ප්‍රවේශ පත්‍ර නිකුත් කරන විනෝදාස්වාද වැඩසටහන්

10.4 බලපත්‍ර ගාස්තුව (වාර්ෂික)

ප්‍රවාහන මාදිලිය	*ඒකකය*	*බලපත්‍ර ගාස්තුව (රු.)*
ගුවන් යානය	එක් ගුවන් යානයකට	500,000.00
නෞකා/මුහුදු යාත්‍රා	එක් නෞකාවකට	1,000,000.00
මගී දුම්රිය	එක් මාර්ගයකට	50,000.00
මගී බස්/කෝච් රථ	එක් වාහනයකට	2,500.00

10.5 බලපත්‍ර ලබාදීමේ පදනම

- බලපත්‍රය, නිශ්චිතව දක්වා ඇති පරිදි එක් එක් වාහනය, යාත්‍රාව හෝ සේවාව පදනම් කරගෙන අදාළ වේ.
- අදාළ මෙහෙයුම්කරු හෝ සේවා සපයන්නා විසින් බලපත්‍රය ලබාගත යුතුය.
- සංගීත නිර්මාණ භාවිතය සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

11. වන්ද්‍රිකා, කේබල් සහ ඩිජිටල් බෙදාහැරීමේ සේවා

11.1 අදාළ වන සේවාවන්

පොදු ජනතාව වෙත ශ්‍රව්‍ය දෘශ්‍ය අන්තර්ගතයන් බෙදාහැරීමේ සේවාවන් සපයනු ලබන පහත දැක්වෙන ආයතන සඳහා මෙම ප්‍රභේදය අදාළ වේ:

- වන්ද්‍රිකා රූපවාහිනී සේවා සපයන්නන්
- කේබල් රූපවාහිනී මෙහෙයුම්කරුවන්
- IPTV සහ ඩිජිටල් රූපවාහිනී පද්ධති
- ඒ හා සමාන වෙනත් ඕනෑම අන්තර්ගත බෙදාහැරීමේ සේවාවන්

11.2 බලපත්‍රයේ විෂයය පථය

රූපවාහිනී අන්තර්ගතයන් අවසාන පරිශීලකයන් වෙත නැවත සම්ප්‍රේෂණය කිරීම හෝ බෙදාහැරීම සිදුකරන පද්ධති හරහා සංගීත නිර්මාණ පොදු ජනතාව වෙත සන්නිවේදනය කිරීම මෙම බලපත්‍රය මගින් ආවරණය වේ.
එවැනි පද්ධති හරහා ගෙන එනු ලබන රූපවාහිනී නාලිකා, වැඩසටහන් සහ ඒ ආශ්‍රිත අන්තර්ගතයන් තුළ අඩංගු වන සංගීත නිර්මාණ සම්ප්‍රේෂණය කිරීම මෙයට ඇතුළත් වේ.

11.3 විෂයය පථයේ සීමාවන්

වෙනම බලපත්‍ර රාමු යටතට යටත් වන්නා වූ ද, අදාළ නීති සහ රීති මගින් නියාමනය කරනු ලබන්නා වූ ද මූලික විකාශන සේවා සඳහා මෙම කොටස අදාළ නොවේ.

11.4 අතිරේක අයිතිවාසිකම් අවශ්‍ය වන භාවිතයන්

සංගීත නිර්මාණවල ඇතැම් භාවිතයන් සඳහා සමමුහුර්තකරණ අයිතිවාසිකම්, නිෂ්පාදන අයිතිවාසිකම් හෝ වෙනත් ආකාරවලින් පවත්නා අයිතිවාසිකම් ඇතුළුව, ACPOSL විසින් පාලනය කරනු නොලබන අයිතිවාසිකම් ඇතුළත් විය හැකිය.
ඒ අනුව, අදාළ අවස්ථාවන්හිදී ප්‍රකාශකයන්, නිෂ්පාදකයන් හෝ වෙනත් බලයලත් පාර්ශවයන් ඇතුළු අදාළ අයිතිවාසිකම් දරන්නන්ගෙන් අතිරේක බලපත්‍ර හෝ අවසර ලබා ගැනීමට පරිශීලකයන්ට සිදු විය හැකිය.
මෙයට පහත සඳහන් දෑ ඇතුළත් විය හැකි නමුත් ඒවාට පමණක් සීමා නොවේ:

- රූපවාහිනී වැඩසටහන්, චිත්‍රපට හෝ වෙළඳ දැන්වීම් සඳහා සංගීත නිර්මාණ භාවිත කිරීම
- තේමා සංගීතය හෝ විශේෂයෙන් ඇණවුම් කර නිර්මාණය කරන ලද කෘති භාවිත කිරීම
- දෘශ්‍ය අන්තර්ගතයන් සමග සංගීතය සමමුහුර්තකරණය කිරීම ඇතුළත් ඕනෑම භාවිතයක්

11.5 බලපත්‍ර ගාස්තු (වාර්ෂික)

වර්ගය	*බලපත්‍ර ගාස්තුව (රු.)*
වන්දිකා / කේබල් / IPTV මෙහෙයුම්කරු	500,000.00

11.6 බලපත්‍ර ලබාදීමේ පදනම

- බලපත්‍රය එක් එක් මෙහෙයුම්කරු හෝ සේවා සපයන්නා පදනම් කරගෙන අදාළ වේ.
- එක් එක් පද්ධතිය හෝ සේවාව සඳහා වෙනම බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ.
- සංගීත නිර්මාණ භාවිතය සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

12. සහනදායී සහ විශේෂ බලපත්‍ර
12.1 අදාළ වන ප්‍රභේද

වාණිජ නොවන හෝ සමාජීය වශයෙන් වාසිදායක අරමුණු සඳහා සංගීත නිර්මාණ භාවිත කරනු ලබන පහත දැක්වෙන ප්‍රභේද සඳහා මෙය අදාළ වේ:

- ලියාපදිංචි පුණ්‍යායතන
- අධ්‍යාපන ආයතන (පාසල්, විශ්වවිද්‍යාල, පුහුණු ආයතන)
- ආගමික ස්ථාන (පන්සල්, පල්ලි, කෝවිල් සහ ඒ හා සමාන ආයතන)
- ප්‍රජා සහ සංස්කෘතික සංවිධාන
- රජයේ හෝ පළාත් පාලන ආයතනවල සමාජ සුභසාධන වැඩසටහන්

12.2 සුදුසුකම් ලැබීමේ නිර්ණායක

සහනදායී බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය:

- අදාළ නීති යටතේ නීත්‍යානුකූලව ලියාපදිංචි වී තිබීම හෝ පිළිගැනීමට ලක්ව තිබීම.
- සංගීතය භාවිත කිරීමේ අරමුණ ස්වභාවයෙන්ම වාණිජ නොවන බව සනාථ කිරීම.
- එමඟින් ලැබෙන යම් ආදායමක් වේ නම්, එය පුණ්‍ය, අධ්‍යාපනික, ආගමික හෝ ප්‍රජා අරමුණු සඳහාම පමණක් යොදවන බවට සහතික වීම.
- ACPOSL විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම උපකාරක ලේඛනයක් සපයා දීම.

12.3 බලපත්‍රයේ විෂය පථය

ඉහත දක්වා ඇති සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරාලන උත්සව හෝ ක්‍රියාකාරකම්වලදී සංගීත නිර්මාණ භාවිත කිරීම සඳහා මෙම බලපත්‍රය අදාළ වේ.
මෙම කොටස යටතේ පැහැදිලිව දක්වා නොමැති නම්, අදාළ ගාස්තු ප්‍රභේදයන්හි අනෙකුත් සියලුම කොන්දේසි තවදුරටත් අදාළ වනු ඇත.

12.4 සහනදායී ගාස්තු

සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පහත සඳහන් පරිදි අඩු කරන ලද බලපත්‍ර ගාස්තු ප්‍රදානය කරනු ලැබිය හැකිය:

- පුණ්‍යායතන – 50% දක්වා ගාස්තු අඩු කිරීමක්
- අධ්‍යාපන ආයතන – 25% දක්වා ගාස්තු අඩු කිරීමක්
- ආගමික / සංස්කෘතික සංවිධාන – 25% දක්වා ගාස්තු අඩු කිරීමක්

අදාළ වැඩසටහනේ හෝ භාවිතයේ ස්වභාවය, පරිමාණය සහ අරමුණ මත පදනම්ව, හරියටම ලබා දෙනු ලබන ගාස්තු අඩු කිරීම ACPOSL විසින් තීරණය කරනු ලැබේ.

12.5 සීමාවන්

පහත සඳහන් අවස්ථාවලදී සහනදායී ගාස්තු අදාළ නොවේ:

- අදාළ උත්සවය හෝ ක්‍රියාකාරකම ස්වභාවයෙන්ම වාණිජමය එකක් වන විට.
- උත්සවය සඳහා අනුග්‍රහය දක්වා ඇති විට හෝ එය සන්නාම ප්‍රචාරණය සඳහා සම්බන්ධ වන විට.
- ලාභ ලැබීමේ අරමුණින් ඇතුළුවීමේ ගාස්තු හෝ වෙනත් අය කිරීම් සිදු කරනු ලබන විට.
- සංගීතය භාවිත කිරීම වාණිජමය විනෝදාස්වාද සැපයුමක කොටසක් ලෙස පවතින විට.

12.6 තීරණය කිරීම සහ අනුමත කිරීම

සහනදායී බලපත්‍ර සඳහා වන සියලුම අයදුම්පත් ACPOSL හි සමාලෝචනයට සහ අනුමැතියට යටත් විය යුතුය.
අරමුණු නිර්ණායක මත පදනම්ව, සහනදායී ගාස්තු ප්‍රදානය කිරීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති අයිතිය ACPOSL සතු වේ.

12.7 බලපත්‍ර ලබාදීමේ පදනම

- අදාළත්වය අනුව, සහනදායී බලපත්‍ර එක් එක් උත්සවය හෝ එක් එක් භාවිතය පදනම් කරගෙන අදාළ වේ.
- සංගීත නිර්මාණ භාවිත කිරීමට පෙර අයදුම්කරුවන් විසින් ඒ සඳහා වන අනුමැතිය ලබාගත යුතුය.
- සුදුසුකම් සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීමේ අයිතිය ACPOSL සතු වේ.

නිලාර් එන්. කාසිම්,
සභාපති,
ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සහ ප්‍රකාශකයන්ගේ සංගමය.

06 - 31